# මාධ්‍ය නිවේදනය

## පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට 5 ශ්‍රේණිය සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2025

## ප්‍රතිඵල නිකුත් කිරීම

2025 අගෝස්තු මස 10 වන දින පැවති උක්ත විභාගයේ ප්‍රතිඵල, 2025 සැප්තැම්බර් මස 03 වන දින නිකුත් කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

- **අයදුම් කළ සංඛ්‍යාව** - 308026
- **පෙනී සිටි සංඛ්‍යාව** - 303670
- **කඩඉම් ලකුණෙන් ඉහළ සංඛ්‍යාව** - 51969

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවි වන www.doenets.lk හෝ www.results.exams.gov.lk වෙත පිවිස ප්‍රතිඵල ලබා ගත හැකි ය.

- ❖ විභාග අයදුම්කරුගේ නිවැරදි විභාග අංකය ඇතුළත් කිරීමෙන් ප්‍රතිඵල ලබා ගත හැකි අතර, අදාළ විභාග ප්‍රතිඵල සටහන බාගත කර මුද්‍රිත පිටපතක් ලබා ගැනීමටද පහසුකම් සලසා ඇත.
- ❖ ශිෂ්‍යාධාර ලබා දෙන අයදුම්කරුවන් සංඛ්‍යාව 20,000ක් වන අතර, ඒ අතුරින් ශිෂ්‍යත්ව 250ක් විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් සඳහා වෙන් කර ඇත.
- ❖ විභාග අයදුම්කරු ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාව, දිස්ත්‍රික්කය හා මාධ්‍යය අනුව කඩඉම් ලකුණු සීමාව තීරණය කර ඇත.
- ❖ විශේෂ අවශ්‍යතා කාණ්ඩය යටතේ ශිෂ්‍යත්ව හිමිකම් ලබන අයදුම්කරුවන්ගේ මුළු ලකුණු සමග ශිෂ්‍යත්ව හිමිකම් ලැබූ බවට විශේෂ සටහනක් ඇතුළත් කර ඇත.

02. විදුහල්පතිවරුන් වෙත ලබා දී ඇති පරිශීලක නාම (UserName) සහ මුරපද (Password) භාවිත කර, 2025.09.04 දින සිට අදාළ පාසලේ විභාග ප්‍රතිඵල ලේඛනය බාගත කර ගැනීමට **https://onlineexams.gov.lk./eic** හි School Account Login හරහා ප්‍රවේශවන්න. අපේක්ෂකයන්ගේ කේවල සහතිකපත්, අභියාචනා සලකා බැලීමෙන් පසු පාසල් වෙත තැපැල් මඟින් යොමු කරනු ලැබේ.

03. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලබා දී ඇති පරිශීලක නාම සහ මුරපද භාවිත කර, තම පළාතේ/කලාපයේ සියලු පාසල්වල ප්‍රතිඵල ලේඛන බාගත කර ගැනීම සඳහා **https://onlineexams.gov.lk./onlineapps** හි Exam Result Sheets මත Click කරන්න.

04. කිසියම් විභාග අපේක්ෂකයකුගේ ලකුණු පිළිබඳව අභියාචනා කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා මාර්ගගතව අභියාචනා ඉදිරිපත් කල යුතු දිනය පසුව දැනුම්දෙනු ලැබේ.

**විමසීම්**

| | | |
|---|---|---|
| **ක්ෂණික ඇමතුම් අංකය** | - | **1911** |
| **පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව** | - | **0112784208 / 0112784537**<br>**0112786616 / 0112785922** |

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්